8 – ශ්‍රේණිය

# ප්‍රවෘත්ති

19

- ❖ නිපුණතාව - සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි .
- ▪ නිපුණතා මට්ටම - සාවධානව සවන් දී තොරතුරු රැස් කරයි .
- ❖ ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි .
- ▪ විරාම ලකුණු නිවැරදිව භාවිත කරමින් ලියයි .



# ක්‍රියාකාරකම - 1

➢ පහත දැක්වෙන ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු තෝරා ලියන්න .

1. ජන මාධ්‍යයට අයත් වන්නේ මොනවා ද ? ------------------------------------

2. ගුවන්විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යයක් ලෙස හැඳින්වීමට හේතුව කුමක් ද ? ------------------------

3. ගුවන්විදුලි නිවේදකයා වැඩසටහන් ඉදිරිපත් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් නම් කරන්න .----------------

4. ප්‍රවෘත්ති ප්‍රකාශයක දී මුලින් ම ඉදිරිපත් කරන්නේ මොනවා ද ?----------------------------

5. ‘ප්‍රවෘත්ති’ පාඩමේ අන්තර්ගත වී ඇත්තේ මොනවා ද ?------------------------------

- **සිරස්තල යි**
- **රූපවාහිනිය, ගුවන්විදුලිය , පුවත්පත් , අන්තර්ජාලය**
- **ශ්‍රීලංකා ගුවන්විදුලි සංස්ථාවෙන් විකාශය වූ විවිධ ප්‍රවෘත්ති තුනක්**
- **ඇසීම හෙවත් ශ්‍රවණය සඳහා  සකස් වී ඇති මාධ්‍යයක් නිසා**
- **නිවැරදිව ශබ්ද උච්චාරණය**

# ක්‍රියාකාරකම - 2

➢ ***පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න .***

ප්‍රථම විද්‍යුත් මාධ්‍ය ලෙස බිහි වූ ගුවන්විදුලිය වර්තමානයේ ද ප්‍රමුඛතම සන්නිවේදන මාධ්‍යයකි .ගුවන්විදුලි ප්‍රවෘත්ති මෙහිදී ග්‍රාහකයන්ට වැඩිම බලපෑමක් ඇති කරන වැඩසටහන ලෙස පෙන්වා දිය හැකිය .මෙහිදී ප්‍රධාන ක්‍රියාවලිය වන්නේ ප්‍රවෘත්ති සංස්කරණයයි .සංස්කරණයට ලක් කිරීම සඳහා ප්‍රවෘත්තියක් සංස්කාරවරයෙකුට ලැබෙන්නේ ප්‍රවෘත්ති වාර්තාකරණය මඟිනි .වාර්තාකරුවෙකු විසින් ප්‍රවෘත්තියක් සංස්කාරවරයෙකු වෙත ලබා දෙන විට එම තොරතුරු නිවැරැදි බවට තහවුරු කර ඇතැයි යන වගකීම වාර්තාකරු විසින් දැරීම වාර්තාකරණ වෘත්තියේ මූලික මූලධර්මයකි .ප්‍රවෘත්ති සංස්කරණයක් නිරවුල් හා පැහැදිලි විය යුතුය.එමෙන්ම කෙටියෙන් හා සරලව ඉදිරිපත් කළ යුතුය.ප්‍රවෘත්තියේ අන්තර්ගතය වැදගත්කම අනුව පෙළ ගැස්වීමට කටයුතු කිරීමද වැදගත් වේ .ශ්‍රීලංකා ගුවන්විදුලි සංස්ථාවේ විකාශය වන දෛනික ප්‍රවෘත්ති ප්‍රකාශ හතරකි .ඒවානම් පෙ.ව . 6.00, ප. ව . 12.45, ප. ව . 6.00 සහ ප.ව. 9.00 වේ. මෙහිදී වැඩිම ප්‍රවෘත්ති ප්‍රරිමාවක් සහිත ප්‍රවෘත්ති ප්‍රකාශය වන්නේ පස්වරු 6.00 ප්‍රවෘත්ති විකාශයයි .

1. ග්‍රාහකයන්ට වැඩිම බලපෑමක් ඇති කරනු ලබන ගුවන්විදුලි වඩසටහන කුමක් ද ?-----------------------------------------------
2. ප්‍රවෘත්ති වාර්තාකරණයේ මූලික මූලධර්මයක් නම් කරන්න .----------------------------------------------------
3. ප්‍රවෘත්ති සංස්කරණයේ පැවතිය යුතු වැදගත් ලක්ෂණ තුනක් නම් කරන්න .--------------------------------------------
4. ප්‍රවෘත්තියක අන්තර්ගතය කෙසේ සකස්විය යුතු ද ?-----------------------------------------------
5. ශ්‍රීලංකා ගුවන්විදුලි සංස්ථාවේ විකාශයවන දෛනික ප්‍රවෘත්ති ප්‍රකාශ සංඛ්‍යාව කොපමණ ද ?----------------------------------------

# ක්‍රියාකාරකම - 3

***පහත සඳහන් ප්‍රකාශ ඇතුළත් ප්‍රවෘත්ති නිවේදනය සොයා යා කරන්න .***

1 . නිපෝන් මාරු නෞකාව දිවයිනට පැමිණීම ගැන කිවෙයි .

2 . ලෝකයේ මී මැස්සන් හා පරාග පෝෂණ සතුන් වඳ වී යාම .

3 . ආසියාතික මලල ක්‍රීඩා උලෙළ පිළිබඳව .

4 . මිනිස් ක්‍රියාකාරකම් නිසා මිහි තලය දිනෙන් දින උණුසුම් වීම .

5 . රටවල් දොළොහකින් තරුණ පිරිස් පැමිණීම

6 . කෘමි සතින් විනාශ වීමට කෘමිනාශක භාවිතය හේතු වී ඇති බව .

7 .විහාරස්ථාන කිහිපයක ශ්‍රමදාන කටයුතු කිරීම .

8 .ඩබ්ලිව්. කේ . හිමාෂ මීටර් 100 ඉසව්වෙන් රන් පදක්කම දිනා ගැනීම

9 . දොඩන්ගොඩ නගරයේදී පිළිගැනීමේ උත්සවයක් පැවති බව .

10 . ලංකාව නියෝජනය කරන සංඛ්‍යාව දොළහකි .

පළමු ප්‍රවෘත්ති

දෙවන ප්‍රවෘත්ති

තුන්වන ප්‍රවෘත්ති

# ක්‍රියාකාරකම - 4

පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න .

1 . රූපවාහිනිය , ගුවන්විදුලිය , පුවත්පත් හා අන්තර්ජාලය ...................... ලෙස හැඳින්වෙයි
2 . ගුවන්විදුලිය ........................ මාධ්‍යයකි .
3 . දෙවන ප්‍රවෘත්තියෙන් කියවෙන්නේ .................... පාරිසරික ගැටලුව යි .
4 . ප්‍රවෘත්ති ප්‍රකාශනයක දි මුලින්ම ඉදිරිපත් කරන්නේ .................. යි .
5 . ගුවන්විදුලි ප්‍රවෘත්තිවල දී මූලික වන්නේ ..................... ය .
6 . කෘමිනාශක භාවිතය හා මිනිස් ක්‍රියාකාරකම් .................... ප්‍රවෘත්තියෙන් ප්‍රකාශ වේ .
7 . නිපෝන් මාරු නෞකාවෙන් මෙරටට පැමිණි පිරිස.................. කි .
8 . හිමාෂ ඊෂාන් අකුරු කර වූයේ ......................... ජාතික පාසලෙනි .
9 . රිය පෙරහැර පටන් ගත්තේ ....................... විද්‍යාලය අසල සිට ය .
10 . නිපෝන් මාරු නෞකාවෙන් මෙරටට පැමිණි තරුණ පිරිස ................... ප්‍රදේශයේ නිවාස 125 ක රැඳී සිටිති

දෙසිය හතළිස් තුන    තුන්වන
කෘමි සතුන් වඳ වීමේ    මිරිස්වත්ත    ශ්‍රව්‍ය
කැස්බෑව    ප්‍රවෘත්ති සිරස්තල    කොස්වත්ත
ජන මාධ්‍ය    ප්‍රවෘත්ති සිරස්තල    හඬ පෞරුෂය

# ක්‍රියාකාරකම - 5

- ***පහත සඳහන් එක් එක් පාඨ්ට සුදුසු විරාම ලකුණු යොදන්න .***

1 . බොහෝ රටවල පවතින ආර්ථික දුෂ්කරතා නිසා අපේ අපනයන මෙරටින් පිටරට යවන භාණ්ඩ සඳහා ඉල්ලුම අඩු වී ඇත .

2 . මුනි සිරිපා සිඹිමින්නේ - ගිරි පෙදෙසින්නේ

3 . සතුන් වඳ වී යෑමේ තර්ජනයක් පවතින බව්

4 . ව්‍යායාමය රජ සැප පිණිස නොවේ .

5 . පාසලේ සිට මගේ නිවසට කිලෝ මීටර් කී .

6 . ගුරු සිත නොරිදවා - බැති උපදවා

7 . මමකැමති නෑ ඒවා ගැන කතා කරන්න

8 . ශ්‍රී ලංකාවේ ගොවිතැන ගොඩ , මඩ නගා සිටුවීම සඳහා නූතන තාක්ෂණය යොදා ගනී .

# ක්‍රියාකාරකම - 6

***හිස් තැන් පුරවන්න***

1ප්‍රකාශයක හිස්තැන් දැක්වීම සඳහා --------------------- යෙදේ .

2 . ලේඛනයේ දී මග හැරුණු අකුරක් ,පදයක් හෝ වාක්‍ය ඛණ්ඩයක් ඇතුළත් කිරීම සඳහා ---------යොදනු ලැබේ .

3 . සංවාද ලිවීමේදී ප්‍රකාශයා හමක් කල්පනා කරන බව පෙන්වීමේදී -----------යෙදේ .

4 . යම් ප්‍රකාශයක් වැඩිදුරටත් පැහැදිලි කිරීමේදි ------------------------ භාවිත වෙයි .

5 . පාඨයක මුල හෝ අග හෝ කොටසක් අත්හල බව දැක්වීමට ---------------    යොදනු ලැබේ .

6 .වරහන් තුළ දැක්විය යුතු ප්‍රකාශනයක ම සරල වරහන යෙදෙන පාඨයක් ඇත්නම් මුළු ප්‍රකාශනය ම ------------- තුළ යොදනු ලැබේ .

7 . කිසියම් කාල සීමාවක් දැක්වීමේදී ------------------------- යෙදේ .

8 .අක්ෂර ,අංක ආදිය ආශ්‍රයෙන් අනුපිළිවෙළ හෝ කොටස් දැක්වීමේදි  ----------------- යෙදේ .

- සරල වරහන
- සඟල වරහන
- තිත් තුන
- කාක පාදය

# ක්‍රියාකාරකම - 7

❖ **පහත සඳහන් විරාම ලකුණු හඳුන්වන නම් සොයා යා කරන්න .**

ප්‍රශ්න ලකුණ

විස්මයාදි ලකුණ

ඇල ඉර

වරහන

තනි උඩු කොමා

කෙටි ඉර

[ . ]

[ , ]

[ ; ]

[ : ]

[ - ]

[ “ ” ]

[ ‘ ’ ]

[ ’ ]

[ ? ]

[ ! ]

[ / ]

[ ( ) ]

තිත් කොමාව

තිත

යුගල උඩු කොමා

තනි උඩු කොමාව

දෙතිත

කොමාව

❖ **ප්‍රායෝගික අභ්‍යාස**

ඔබ සවන් දුන් ප්‍රවෘත්ති ප්‍රකාශ 05 ක් ඇසුරු කර ගෙන පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න .

| දිනය | වෙලාව | ගුවන්විදුලි නාලිකාව | සිරස්තලය | ඉදිරිපත් කළ කරුණු සාරාංසය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

# ක්‍රියාකාරකම - 1
# පිළිතුරු



1. ජන මාධ්‍ය ලෙස හඳුන්වනු ලබන අංග නම් කරන්න . රූපවාහිනිය, ගුවන්විදුලිය , පුවත්පත් , අන්තර්ජාලය
2. ගුවන්විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යයක් ලෙස හැඳින්වීමට හේතුව කුමක් ද ? ඇසීම හෙවත් ශ්‍රවණය සඳහා සකස් වී ඇති මාධ්‍යයක් නිසා
3. ගුවන්විදුලි නිවේදකයා වැඩසටහන් ඉදිරිපත් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් නම් කරන්න . නිවැරදිව ශබ්ද උච්චාරණය
4. ප්‍රවෘත්ති ප්‍රකාශයක දී මුලින් ම ඉදිරිපත් කරන්නේ මොනවා ද ? සිරස්තල යි
5. ‘ප්‍රවෘත්ති’ පාඩමේ අන්තර්ගත වී ඇත්තේ මොනවා ද ? ශ්‍රීලංකා ගුවන්විදුලි සංස්ථාවෙන් විකාශය වූ විවිධ ප්‍රවෘත්ති තුනක්

# ක්‍රියාකාරකම - 2
# පිළිතුරු



1. ග්‍රහකයන්ට වැඩිම බලපෑමක් ඇති කරනු ලබන ගුවන්විදුලි වඩසටහන කුමක් ද ? ගුවන්විදුලි ප්‍රවෘත්ති
2. ප්‍රවෘත්ති වාර්තාකරණයේ මූලික මූලධර්මයක් නම් කරන්න . වාර්තාකරුවෙකු විසින් ප්‍රවෘත්තියක් සංස්කාරවරයෙකු වෙත ලබා දෙන විට එම තොරතුරු නිවැරැදි බවට තහවුරු කර ඇතැයි යන වගකීම වාර්තාකරු විසින් දැරීම වාර්තාකරණ වෘත්තියේ මූලික මූලධර්මයකි
3. ප්‍රවෘත්ති සංස්කරණයේ පැවතිය යුතු වදගත් ලක්ෂණ තුනක් නම් කරන්න . නිරවුල් විය යුතුයි ,පැහැදිලි විය යුතුය, කෙටියෙන් හා සරලව ඉදිරිපත් කළ යුතුය.ප
4. ප්‍රවෘත්තියක අන්තර්ගතය කෙසේ සකස්විය යුතු ද ? ප්‍රවෘත්තියේ අන්තර්ගතය වැදගත්කම අනුව පෙළ ගැස්විය යුතුය.
5. ශ්‍රීලංකා ගුවන්විදුලි සංස්ථාවේ විකාශයවන දෛනික ප්‍රවෘත්ති ප්‍රකාශ සංඛ්‍යාව කොපමණ ද ? හතරකි



# ක්‍රියාකාරකම - 3
# පිළිතුරු

1 . නිපෝන් මාරු නෞකාව දිවයිනට පැමිණීම ගැන කිවෙයි .

2 . ලෝකයේ මී මැස්සන් හා පරාග පෝෂණ සතුන් වඳ වී යාම .

3 . ආසියාතික මලල ක්‍රීඩා උලෙළ පිළිබඳව .

4 . මිනිස් ක්‍රියාකාරකම් නිසා මිහි තලය දිනෙන් දින උණුසුම් වීම .

5 . රටවල් දොළොහකින් තරුණ පිරිස් පැමිණීම

6 . කෘමි සතින් විනාශ වීමට කෘමිනාශක භාවිතය හේතු වී ඇති බව .

7 .විහාරස්ථාන කිහිපයක ශ්‍රමදාන කටයුතු කිරීම .

8 .ඩබ්ලිව්. කේ . හිමාෂ මීටර් 100 ඉසව්වෙන් රන් පදක්කම දිනා ගැනීම

9 . දොඩන්ගොඩ නගරයේදී පිළිගැනීමේ උත්සවයක් පැවති බව .

10 . ලංකාව නියෝජනය කරන සංඛ්‍යාව දොළහකි .

පළමු ප්‍රවෘත්ති

දෙවන ප්‍රවෘත්ති

තුන්වන ප්‍රවෘත්ති

# ක්‍රියාකාරකම - 4
# පිළිතුරු



1.රූපවාහිනිය , ගුවන්විදුලිය , පුවත්පත් හා අන්තර්ජාලය ජන මාධ්‍ය ලෙස හැඳින්වෙයි

2 . ගුවන්විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යයකි .

3 . දෙවන ප්‍රවෘත්තියෙන් කියවෙන්නේ කෘමි සතුන් වඳ වීමේ පාරිසරික ගැටලුව යි .

4 . ප්‍රවෘත්ති ප්‍රකාශනයක දි මුලින්ම ඉදිරිපත් කරන්නේ ප්‍රවෘත්ති සිරස්තල යි .

5 . ගුවන්විදුලි ප්‍රවෘත්තිවල දී මූලික වන්නේ හඬ පෞරුෂ ය .

6 . කෘමිනාශක භාවිතය හා මිනිස් ක්‍රියාකාරකම් දෙවන ප්‍රවෘත්තියෙන් ප්‍රකාශ වේ .

7 . නිපෝන් මාරු නෞකාවෙන් මෙරටට පැමිණි පිරිස දෙසිය හතළිස් තුන කි .

8 . හිමාෂ ඒෂාන් අකුරු කර වූයේ මිරිස්වත්ත ජාතික පාසලෙනි .

9 . රිය පෙරහැර පටන් ගත්තේ කොස්වත්ත විද්‍යාලය අසල සිට ය .

10 . නිපෝන් මාරු නෞකාවෙන් මෙරටට පැමිණි තරුණ පිරිස කැස්බෑව ප්‍රදේශයේ නිවාස 125 ක රැඳී සිටිති

# ක්‍රියාකාරකම - 5
# පිළිතුරු



1 . (මෙරටින් පිටරට යවන )

2 . සමනල

^ ගිරි පෙදෙසින්නේ

3 . . .... සතුන් වඳ වී යෑමේ තර්ජනයක් පවතින බව..... .

4 . ... ව්‍යායාමය

5 . කිලෝ මීටර් ......කි .

පෙම්

6 . බැති^ උපදවා

7 . ... මමකැමති නෑ ...

8 . (ගොඩ , මඩ )

# ක්‍රියාකාරකම - 6
# පිළිතුරු



1.ප්‍රකාශයක හිස්තැන් දැක්වීම සඳහා **තිත් තුන** යෙදේ .

2 . ලේඛනයේ දී මග හැරුණු අකුරක් ,පදයක් හෝ වාක්‍ය ඛණ්ඩයක් ඇතුළත් කිරීම සඳහා **කාක පාදය** යොදනු ලැබේ .

3 . සංවාද ලිවීමේදී ප්‍රකාශයා හමක් කල්පනා කරන බව පෙන්වීමේදී **තිත් තුන** යෙදේ .

4 . යම් ප්‍රකාශයක් වැඩිදුරටත් පැහැදිලි කිරීමේදි **සඟල වරහන** භාවිත වෙයි .

5 . පාඨයක මුල හෝ අග හෝ කොටසක් අත්හල බව දැක්වීමට **තිත් තුන** යොදනු ලැබේ .

6 .වරහන් තුළ දැක්විය යුතු ප්‍රකාශනයක ම සරල වරහන යෙදෙන පාඨයක් ඇත්නම් මුළු ප්‍රකාශනය ම **සඟල වරහන** තුළ යොදනු ලැබේ .

7 . කිසියම් කාල සීමාවක් දැක්වීමේදී **සරල වරහන** යෙදේ .

8 .අක්ෂර ,අංක ආදිය ආශ්‍රයෙන් අනුපිළිවෙළ හෝ කොටස් දැක්වීමේදි **සරල වරහන** යෙදේ .

# ක්‍රියාකාරකම - 7
# පිළිතුරු



❖ පහත සඳහන් විරාම ලකුණු හඳුන්වන නම් සොයා යා කරන්න .

ප්‍රශ්න ලකුණ

විස්මයාදි ලකුණ

ඇල ඉර

වරහන

තනි උඩු කොමා

කෙටි ඉර

[ . ]

[ , ]

[ : ]

[ : ]

[ - ]

[“ ”]

[‘ ’]

[ ’ ]

[ ? ]

[ ! ]

[ / ]

[ ( ) ]

තිත් කොමාව

තිත

යුගල උඩු කොමා

තනි උඩු කොමාව

දෙතිත

කොමාව